(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 370.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ජූනි මස 18 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2622/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී උතුරු වසන්තය වැඩසටහන යටතේ, උතුරු පළාතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන් සඳහා,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැය කළ මුදල;

(ii) විෂය මට්ටමින් වැය කළ මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උතුරු පළාතේ සංවර්ධනය සඳහා ඉහත වැඩසටහන් ප්‍රමාණවත්වේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3152/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඔලුවිල් වරායේ සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(ii) අඛණ්ඩව මූල්‍යමය අලාභ ලබමින් සිටින ශ්‍රී ලංකා වරාය අධිකාරියට තරගකාරී විය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2007 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රාග්ධන සහ සාමාන්‍ය සංචිත විචලනයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3213/'12

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර මහ නගර සභාව මගින් එක්රැස් කරන කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ගොහාගොඩ නමැති ස්ථානයට බැහැර කරනු ලබන බවත්;

(ii) එම අපද්‍රව්‍ය මහවැලි ගඟට එකතුවීමෙන් ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍රවීම හා දුර්ගන්ධය හේතුවෙන් ප්‍රදේශවාසීන් විවිධ රෝගී තත්ත්වයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහනුවර මහ නගර සභාව මගින් කැළිකසළ විධිමත් ලෙස කළමනාකරණය කොට එය සම්පතක් බවට පත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3447/’13

4.

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සපුරා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) උතුරු මැද පළාතේ එක් එක් අධ්‍යාපන කලාපයේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් සුදුසුකම් නොමැතිව සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ දැනට සේවය කරන ස්ථාන කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සුදුසුකම් නොමැතිව එම පළාතේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

(v) ඉහත තනතුර සඳහා සුදුසුකම් නොමැති පුද්ගලයින් පත්කිරීමේ පදනම කවරේද;

(vi) සුදුසුකම් නොමැති පුද්ගලයන් විසින් තමාට හිමි නැති තනතුරකට ඉහත පරිදි පත්වී අයථා ලෙස දීමනා ලබා ගෙන ඇත්නම්, එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/’13

5.

ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ "මහ සමයම" ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4313/'13

6.
ගරු තිස්ස අත්තනායක මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උඩවලව, යාල, විල්පත්තුව, වස්ගමුව, ගල්ගමුව හා අනුරාධපුර ආදී ප්‍රදේශවල ජීවත් වන ජනතාව තවමත් වන අලින්ගේ ප්‍රහාරවලට ලක්වන බවත්;

(ii) වන අලින්ගෙන් සිදුවන උවදුරුවලින් එම ප්‍රදේශවල ජනතාව බේරා ගැනීමේ පිළියමක් ලෙස 2002 වර්ෂයේ සිට විදුලි වැටවල් නඩත්තු කිරීම, වන අලි පලවා හැරීම, දඩයම්කරුවන් හා දඩමස් අලෙවි කරන්නන් නීතිය හමුවට ගෙන ඒම ආදී කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනියම් කම්කරුවන් ලෙස පුද්ගලයින් බඳවා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි පරිදි බඳවා ගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013.01.01 දින සිට එම සේවකයින්ගේ සේවය අත්හිටුවා ඇති බැවින් එම ප්‍රදේශවල වන අලින්ගෙන් සිදුවන අනතුරු නැවත වර්ධනය වී ඇති බවත්, රැකියා අහිමි වූ එම පිරිස දැඩි අපහසුතාවයකට පත්වී ඇති බවත් පිළිගන්නේද;

(iii) එසේ නම්, එම සේවකයින්ට නැවත සේවය ලබාදී, ස්ථිර සේවයේ පිහිටුවා, එම ප්‍රදේශවල පවතින වන අලි ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4318/'13

7.
ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ ජනතාවගේ සාක්ෂරතාවය පිළිබඳව අවසන්වරට සමීක්ෂණයක් කරනු ලැබූ වර්ෂය කවරේද;

(ii) නැගෙනහිර පළාතේ මුළු ජනගහනයෙන් කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ගැහැනු හා පිරිමි ජනගහනයේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 10 දක්වා වූ දරුවන් අතරින් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යොමු නොවූ දරුවන් සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත විමසා ඇති සංඛ්‍යාත්මක අගයන් ප්‍රමාණවත් මට්ටමක පවතින බවට අධ්‍යාපන බලධාරීන් විසින් පිළිගන්නේද;

(ii) කියවීමේ හා ලිවීමේ හැකියාව අඩුවීමට බලපා ඇති බවට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(iii) එම තත්ත්වය වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

8.

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලොක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4587/'13

9.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නගරය තුළ "කැසිනෝ" කිහිපයක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.11.29 දින වන විට කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ "කැසිනෝ" සංඛ්‍යාව සහ ඒවායේ ලියාපදිංචි නම් කවරේද;

(ii) 2006 වර්ෂයේ සිට 2012 දක්වා සහ 2013 වර්ෂයෙහි මුල් කාර්තු තුන සඳහා ඉහත එක් එක් ආයතනය විසින් ගෙවිය යුතු වාර්ෂික බදු, අයකිරීම් සහ වෙනත් ගාස්තු කවරේද;

(iii) ඉහත එක් එක් ආයතනය විසින් ඉහත කී කාල පරිච්ඡේදය සඳහා ගෙවන ලද වාර්ෂික බදු, අයබදු සහ වෙනත් සියලු ගාස්තු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4749/'14

10.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(iii) ප්‍රාදේශීය සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ග අතරින් මේ වන විට කාපට් අතුරා ඇති මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2627/'12

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙන් කරන ලද මුදල් ඒ ඒ වර්ෂ සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3149/'12

12.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ලබාගත් ණය මුදල් හා ඒවායේ ආපසු ගෙවීමේ කාල සීමාවන් වාර්ෂික පදනමින් කවරේද;

(ii) ආදායම් උත්පාදනය කර ණය ආපසු ගෙවන ආකාරය ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

(iii) පැරණි ණය ගෙවීම සඳහා රජය තව තවත් ණය ගැනීම සිදු කරන්නේද;

(iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබා ගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද;

(v) රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ණය, රජයේ බැඳුම්කර යනාදිය හරහා ඇ.එ.ජ ඩොලර් මිලියන 500 ඉක්මවා ණයට ගෙන ඇති අවස්ථා කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3218/'12

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර, තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය පූජාපිටිය ප්‍රාදේශීය සභාවට අයත්, දික්ඔයවත්ත නමැති ඉඩමට බැහැර කරන බවත්;

(ii) බැහැර කරන අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ ජලයට එකතුවීම නිසා අවට ජනතාව රෝගී තත්ත්වයන්ට මුහුණපා ඇති බවත්;

(iii) අපද්‍රව්‍ය මෙම ස්ථානයට ගෙන ගොස් දැමීම නතර කරන ලෙස අදාළ බලධාරීන් දැනුවත් කළද මේ දක්වා විසඳුමක් නොලැබුණු බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

(iv) කැළිකසළ ප්‍රවාහනය කිරීම හේතුවෙන් අවට මාර්ග කිහිපයක්ද මේ වන විට විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කසළ ප්‍රවාහනය නිසා විනාශ වූ මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉවතලන කැළිකසළ ඉහත සඳහන් ස්ථානයට බැහැර කිරීම නතර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

14.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන් එක් එක් බදු වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා, කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබාදීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබාදීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2671/'12

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර තොටුපළවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපළවල් ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තයේ නියැළෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2006 සිට 2012 දක්වා මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා වාර්ෂිකව වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මුදල ඉහත එක් එක් වර්ෂයේදී ධීවර අමාත්‍යාංශයට වෙන් කළ මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළදී මිරිදිය ධීවර කර්මාන්තය වෙනුවෙන් ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබුණේද;

(ii) මිරිදිය ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවරයන්ට ධීවර ආම්පන්න ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මකවේද;

(iii) එසේ නම්, එම වැඩසටහන කවරේද;

(iv) එම වැඩසටහන මිරිදිය ධීවරයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.00 දක්වා විය යුතු ය. අ. භා. 6.00 ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය සිදු නොකළ යුතු බව,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 ජූනි මස 17), "එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය ශ්‍රී ලංකාවේ සංහිඳියාවේ ක්‍රියාදාමයට හා සාමයට හානිකර වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට, අභිමානයට හා උදාරත්වයට අභියෝගයක් වන හෙයින්ද, එකී පරීක්ෂණය සිදු නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 212/'14]

*2.

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 හා 157(5) වැනි වගන්ති සමග කියවිය යුතු, 527 වැනි වගන්තිය යටතේ, සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත සමග කියවිය යුතු, 1891 අංක 16 දරන (123 වැනි අධිකාරය වූ) සමිති ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 දෙසැම්බර් 18 දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සහ 2014 ජනවාරි 27 දිනැති අංක 1847/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ධසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ධසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

11.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**